# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,949 - 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2016.01.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 74 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 74 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 77 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ජනවාරි මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

**බස්නාහිර පළාත්බද මහාධිකරණය - පානදුර**

පානදුර මහාධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2016.01.19 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පමණ පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ භාර ගැනීමේ දී සහ මුදල් ගෙවීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, භාණ්ඩ මිලදී ගැනීමට එන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

06. සියළුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එච්. එම්. අමල් තිලකරත්න,
බස්නාහිර පළාතේ මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
පානදුර.

2015 දෙසැම්බර් මස 16 වැනි දින,
පානදුර මහාධිකරණයේ දී ය.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | 2904/12 | W P - G A - 2716 දරණ හොණ්ඩා යතුරු පැදිය |
| 02. | 2947/13 | W P - T L 6290 දරන බජාජ් යතුරුපැදිය |
| 03. | 3028/13 | W P - V B 2201 දරන බජාජ් යතුරුපැදිය |
| 04. | 3031/13 | 204-2837 දරන බජාජ් ත්‍රීරෝද රථය |
| 05. | 3046/13 | WP - JM 4756 දරන ටී. වී. එස්. යතුරු පැදිය හා හෙල්මට් දෙක |
| 06. | 3181/15 | WP - MU - 2078 දරන සුසුකි යතුරු පැදිය |
| 07. | 3065/14 | ලුමාලා වර්ගයේ පාපැදියක කොටස් |
| 08. | 2949/12A, B | මොනිටරය<br>ස්කෑනරය<br>මධ්‍යම සැකසුම් ඒකකය<br>කලර් ලේසර් ප්‍රින්ටරය<br>යතුරු පුවරුව/මවුසය<br>Ups එක |

01-298

# රජයේ නොවන දැන්වීම්

**මහා ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීමයි

මහා ඒෂියා (ප්‍රයිවට්) ලිමටඩ් 2015 දෙසැම්බර් මස 09 වැනි දින සීමාසහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ ලියාපදිංචි අංකය පීවී 108649 වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 116/10, රොස්මීඩ් පෙදෙස, කොළඹ 07.

සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්ස්
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(ලේකම්වරු)

අංක 116/10, රොස්මීඩ් පෙදෙස,
කොළඹ 07.

01-331

**දැන්වීමයි**

කුරුවිට, නීලිකා බේකරිය පදිංචි ජනක දීපාල් රාමනායක (ජා. හැ. අංක 753334599 වී) වන මා විසින් රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් අනුර මනම්පේරි මහතා විසින් ලියා සහතික කළ අංක 5075 සහ 2013.05.14 දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් ඇටෝර්නි බලකරු වශයෙන් කුරුවිට, කීරගල බංගලා හන්දිය, අංක 605/බී/1 පදිංචි කීරගල ජයනෙත්තිලාගේ අජිත් නිලන්ත (ජා. හැ. අංක 843643370 වී) වෙත පවරන ලද බලය 2015.12.14 දින සිට අවලංගු කරන ලද බවටත් එදිනට පසු ඔහු විසින් සිදුකරනු ලබන කිසිදු කටයුත්තකට මා වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

01-273

### ඇටෝර්නි බලය අහෝසි කිරීම

පිළියන්දල බෝකුන්දර අංක 163, දරන ස්ථානයේ පදිංචි සුජාතා සිරිකුමාරි රණසිංහ වන මම මා විසින් පිළියන්දල බෝකුන්දර අංක 163, දරන ස්ථානයේ පදිංචි දෙන් මැනුවෙල් අන්ද්‍රාදි මුදියන්සේලාගේ දෙන් සනත් හිරන්ජන් අන්ද්‍රාදි යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ලියන මොහොට්ටිගේ තිලකරත්න කබ්රාල් විසින් ලියා සහතික කරන ලද අංක 2811 සහ වර්ෂ 2013.07.09 දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කළ බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙමි. මින් මතු එකී ඇටර්නි බලපත්‍රය මත එකී ඇටර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවකට මම කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

එස්. එස්. රණසිංහ.

01-307

---

### දැන්වීමයි

පහත දක්වා ඇති සමාගමේ සංස්ථාපනය සම්බන්ධයෙන් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමෙහි නම : ද ස්ටයිනර් කොලේජ් (ප්‍රයිවට්) ලිමටඩ්
සමාගමෙහි ලියාපදිංචි අංකය : පී වී 109802
ලියාපදිංචි කාර්යාලය : අංක 26/1ඒ, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ
සංස්ථාපනය කළ දිනය : 2015 නොවැම්බර් 23

එල්. සී. රණසිංහ,
නීතිඥ, සමාගම් ලේකම්.

අංක 13 ඩී, 8 වන පටුමග,
හෙට්ටිමුල්ල.

01-329

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනයකර ඇති බැවින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමෙ නම : අතුල ලක්ෂ්මන් ජයසංග ඉම්පෙක්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 96554
ලියාපදිංචි ලිපිනය : අංක 134/බී, සී ස්ට්‍රීට්, කොළඹ 11.

සමාගමෙ නම : වර්ච්‍යු සර්විසස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 109246
ලියාපදිංචි ලිපිනය : අංක 530/15 මීගමුව පාර, වත්තල.

සමාගමෙ නම : ඇලන් ජෝස් එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 109037
ලියාපදිංචි ලිපිනය : අංක 37/4, මීගමුව පාර, පැලියගොඩ, ගොඩකදුරුවත්ත.

සමාගමෙ නම : නිව් බිෆෝට් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 108705
ලියාපදිංචි ලිපිනය : අංක 27, ශාන්ත ලුසියාස් මාවත, කොටහේන, කොළඹ 13.

සමාගමෙ නම : යොෂ් මාර්කටිං (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 108644
ලියාපදිංචි ලිපිනය : අංක 103 ඒ, බෙංක්ෂේ වීදිය, කොළඹ 11.

සමාගමෙ නම : ක්වීන් ලංකා ජෙම්ස් ඇන්ඩ් ජුවෙලරි (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 109912
ලියාපදිංචි ලිපිනය : අංක 176/38, තිඹිරිගස්යාය පාර, කොළඹ 05

සමාගමෙ නම : ප්‍රියා ට්‍රේඩ් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 109867
ලියාපදිංචි ලිපිනය : අංක 279/3, වනවාසල පාර, කැලණිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩී සොලොෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

01-341

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල කඩුවෙල ''සිරි නිවස'' හි පදිංචි ජා. හැ. අ. 811040576 වී හිමි බුවනෙක බාහු මකරද්වජ දේවනාරායන චිත්‍ර මොහොට්ටාලගේ වලව්වේ නීලකාන්ත සමන් කුමාර කුලරත්න වන මා විසින් නාලන්ද මීගොල්ල පාර ''ලකී නෙස්ට්'' හි පදිංචි ජා හැ. අ. 756843249 වී හිමි නිහරේපොල තිලකරත්න රාජකරුණා බඩල් මුදියන්සේලාගේ අවලා සමුදුමාලී රාජකරුණා තිලකරත්න යන අය වෙත පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් චමින්ද ජානක තුන්බෝවිල මහතා විසින් වර්ෂ 2013ක් වූ අගෝස්තු මස 01 වැනි දින ලියා සහතික කරන ලද අංක 744 දරන සහ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 86 කාණ්ඩයේ 27 පත්‍රිරුවේ දින පොත් අංක 2173 යටතේ 2013.09.03 වැනි දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මහනුවර මධ්‍යම කලාප කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවත් මින්මතු එකී ඇටෝර්නි බලපත්‍රය මගින් ඇටෝර්නි බලකාරිය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් මෙයින් දැනුම් දෙමි.

බුවනෙකබාහු මකරද්වජ දේවනාරායන චිත්‍ර
මොහොට්ටාලගේ වලව්වේ නීලකාන්ත
සමන් කුමාර කුලරත්න.

01-332

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : ලංකා ක්‍රෙඩිට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 110234
සංස්ථාපනය කළ දිනය : 2015.12.03
ලියාපදිංචි කළ ස්ථානය : 301 ඒ, මැද මාවත, අළුබෝමුල්ල.

එච්. පී. ඩී. ද සිල්වා,
සමාගමේ ලේකම්.

01-394

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

2007 අංක 07 දරන සමාගම් පනත අනුව, පහත සඳහන් සමාගම, 2007 නොවැම්බර් මස 10 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : මියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 61996
ලියාපදිංචි ලිපිනය : අංක 63/92 ඒ, දඹහේන පාර, මහරගම.

සමාගම් ලේකම්වරු.

01-429

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඇරෝ කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 110266
දිනය : 2015.12.17
ලියාපදිංචි ලිපිනය : අංක 172, අළුත්කඩේ වීදිය, කොළඹ 12
සමාගමේ ලේකම් : සී. පාලිත ජේ. ඩබ්ලිව්. මැතිව්,
සමාගම් ලේකම්,
එස්. ඊ. සී. 1159/94

01-397

---

### සමාගම් ඒකාබද්ධ කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

කොළඹ 03, ඩීල් පෙදෙසේ අංක 2 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති අංක පී වී 79737 දරන ෆස්ට් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම, කොළඹ 03, ඩීල් පෙදෙසේ අංක 2 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති අංක පීබී 332 දරන ෆස්ට් කැපිටල් ලිමිටඩ් සමාගම සමග 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ වීමේ යෝජනාව.

ෆස්ට් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම, ෆස්ට් කැපිටල් ලිමිටඩ් සමාගම සමග ඒකාබද්ධ වීම සඳහා ඉදිරිපත් වී ඇති යෝජනාව 2016 ජනවාරි මස 12 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමටත්, එම යෝජනාව සමාගම් දෙකෙහි ම ශුභ සිද්ධිය සඳහා ඉවහල් වන බවත්, ඒකාබද්ධ කරනු ලැබීමට නියමිත ෆස්ට් කැපිටල් ලිමිටඩ් ඒකාබද්ධ වූ වහාම ක්‍රියාත්මක වන බවත්, එහි මූල්‍යමය ස්ථාවරත්වය පිළිබඳව සෑහීමකට පත්විය හැකි බවත්, සමාගම් දෙකෙහි ම අධ්‍යක්ෂ මණ්ඩලයන් හි නිගමනය වී ඇති බවත්, මෙයින් දැනුම දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල,

ෆස්ට් කැපිටල් ලිමිටඩ්,
ෆස්ට් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

2015 දෙසැම්බර් මස 04 වැනි දින.

01-405

---

### දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව 2015.11.27 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාපනය කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

සමාගමේ නම : අල්ට්එයාර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 110091
ලියාපදිංචි ලිපිනය : 69/3ඒ, කැටවලමුල්ල පටුමග, කොළඹ 09.

අධ්‍යක්ෂක.

01-423

---

### දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) අනුව 2015.08.12 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

සමාගමේ නම : මයි ප්‍රොපටි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 107682
ලියාපදිංචි ලිපිනය : 3 වැනි මහල, අයි. බී. එම්. ගොඩනැගිල්ල, 48, නවම් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂක.

01-424

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ලිබ්රාට්‍රාන්ස් ඉන්ටර්නැෂනල් කොලම්බෝ පුද්ගලික සමාගම 2007.10.18 වැනි දින සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කර ඇත.

ලියාපදිංචි අංකය : පී වී 61748

ලිපිනය : අංක 84/6, 5 වැනි පටුමග, වලසිංහගොඩ, හෝකන්දර උතුර, හෝකන්දර.

01-442

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නාමය : ඒ. එස්. සෙකියුරිටි සර්විසස් (පී වී ටී) එල්. ටී. ඩී.

ලියාපදිංචි අංකය : පී වී 108975

සංස්ථාගත කළ දිනය : 2015.10.02

ලියාපදිංචි ලිපිනය : අංක 01, මැතිව් නිවාස, හිඹුටුවැල්ගොඩ, කැලණිය.

01-443

---

### ඇටෝර්නි බලය අහෝසි කිරීම

මඩකලපුව, අංක 525, මට්ටිකළි බාර් වීදියේ පදිංචි ඉන්පම් බාලසේකරන් මහත්මිය, යන මා මඩකලපුව පාලමීන් මඩු අංක 112, සිත්ති විනායගර් කෝවිල පාරේ පදිංචිව සිටින, ජාතික හැඳුනුම්පත් අංකය, 615964522 වී ට අයත් දේවිකා ශ්‍රී රාමචන්ද්‍රිරා මහත්මියට මා විසින් ලබාදුන් මඩකලපුව, ප්‍රසිද්ධ නොතාරිස් කි. තුරෛරාජසිංගම් මහතා විසින් 117 අංකයේ 2005.01.20 වැනි දින සහතික කරන ලද ඇටෝර්නි බලය මෙයින් අහෝසි කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ද, එම රජයේ සියලු ජනතාවට ද, මෙයින් දැනුම් දෙමි. ඉහත ඇටෝර්නි බලය මගින් දේවිකා ශ්‍රී රාමචන්ද්‍රිරා මහත්මිය විසින් අද සිට කරනු ලබන ගනුදෙනු කිසිවකටත් හා වෙනත් ක්‍රියාකාරකම්වලටත් මා වග නොකියන බව මෙයින් දැනුම් දෙමි.

ඉන්පම් බාලසේකරන් මහත්මිය.

01-395

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - ගම්පහ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 223 අකරවිට ග්‍රාම නිලධාරි වසමේ, අකරවිට ගමේ පිහිටි අටුවේකනත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ජේ. පෙරේරා විසින් 2007 දෙසැම්බර් මස 26 වැනි දින සාදන ලද අංක 2145 දරන පිඹුරෙන් බෙදු වෙන්කොට ඇති ලොට් 1 දරන ප්‍රමාණය,

රූඩ් එකයි පර්චස් තිස් එකයි දශම පහයි අට (අ. 0, රූ. 1, පර්. 31.58) විශාල ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

නිශ්ශංක ආරච්චිගේ දයාශාන්ත ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත සඳහන් දේපළ වර්ෂ 2016ක් වූ පෙබරවාරි මස 11 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2015.10.23 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳව දැන්වීම සඳහා 2016.01.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2016.01.11 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - ගම්පහ නගරයේ සිට ජාඇල ප්‍රධාන මාර්ගයේ (A 33) කිලෝමීටර් 2 ක් පමණ ගොස් අකරවිටට පැමිණි විට අදාළ දේපළ ප්‍රධාන පාරට යාව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු ය. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගම්පහ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කාරීම හ වැඩි විස්තර සඳහා පහත අය විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 200, උසාවි පාර,
කෙළඹ 12.
දුරකථන/ෆැක්ස් : 011 2445393.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 51, මේරි රැජින පාර,
ගම්පහ.
දුරකථන අංක 033 - 2224136 - 7,
ෆැක්ස් අංකය : 033 2234201.

01-340

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
(කලින් DFCC බැංකුව)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළ සහ යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 25268 සහ 26634 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ නගර සභා සීමාවට අයත්, ගම්පහ පහළගම ග්‍රාමයේ පිහිටි අංක 233- 233/1 ජා-ඇල පාර යන ලිපිනය දරන රුක්කත්තන-ගහකුඹුර ලෙස හැඳින්වෙන (වර්තමානයේ උස් බිමක්) බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් සාදන ලද 1999 ජනවාරි මස 11 වැනි දිනැති අංක 352 දරන පිඹුරේ ලොට් අංක ඒ ලෙස දක්වෙන සීමා නිර්ණය කර බෙද වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0, රූඩ් 01, පර්. 10.33 (හෙක්ටයාර් 0.1273) එහි පිහිටි ගොඩනැගිලි සහ සියල්ල සහිතව

පහත විස්තර කෙරෙන යන්ත්‍ර සූත්‍ර සමග

| | *විස්තරය* | *විස්තරය/ප්‍රමාණය* |
|---|---|---|
| 1. | බැන්ඩ් සෝ (ලෝකල්) | 01 |
| 2. | මෝල්ඩින්ග් මැෂින් (16 ඉන්ච් බ්ලේඩ්) | 01 |
| 3. | වුඩ්වර්කින් මැෂින් (ඉන්ග්ලිෂ් ඔරිජින්) | 01 |
| 4. | වුඩ්වර්කින් මැෂින් (ලෝකල්) | 01 |
| 5. | තික්නස් ප්ලැනර් මැෂින් (බුලාරෙයින්) | 01 |
| 6. | තික්නස් ප්ලැනර් මැෂින් (ඉටලියන්) | 01 |
| 7. | වුඩ්වර්කින් මැෂින් (ජැපනීස්) | 01 |
| 8. | වුඩ්වර්කින් මැෂින් (ලෝකල්) | 01 |
| 9. | ප්ලැනර් මැෂින් (ලෝකල් | 01 |
| 10. | වුඩ්වර්කින් මැෂින් (ජැපනීස්) | 01 |
| 11. | බැන්ඩ් සෝ (ලෝකල්) | 01 |
| 12. | ජිග්සෝ මැෂින් (ලෝකල්) | 01 |

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද, 2007 සැප්තැම්බර් මස 14 වැනි දිනැති අංක 25268 දරන සහ 2009 ජූලි මස 29 වැනි දිනැති අංක 26634 දරන උකස්කරයන් ප්‍රකාර ගම්පහ පහළගම දයාශාන්ත ලී වෙළඳසැල නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන නිශ්ශංක ආරච්චිගේ දයාශාන්ත යන අය විසින් ඩී එෆ් සී සී බැංකුවට (කලින් ඩිවෙලොප්මන්ට් ෆයිනෑන්ස් කෝපරේෂන් ඔෆ් සිලෝන් ලෙස හැඳින්වූ) උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2016 ජනවාරි මස 27 වැනි දින (බදාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 78,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011 2371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 124 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-311